# INSURANCE
# (Part-I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# රක්ෂණය

රක්ෂිතයා විසින් වාරික ගෙවීමටත්, රක්ෂිත උපද්‍රව හේතුවෙන් රක්ෂිතයාට සිදු විය හැකි අලාභ සඳහා රක්ෂකයා විසින් වන්දි ගෙවීමටත්, රක්ෂිතයෙකු හා රක්ෂකයෙකු අතර ඇති කර ගන්නා එකඟතාව රක්ෂණය ලෙස හැඳින්විය හැකි ය.

## අවදානම

රක්ෂණයේ දී මූල්‍යමය වශයෙන් ඇස්තමේන්තු කළ හැකි හානියක් සිදු වීමට ඇති ඉඩකඩ අවදානමක් ලෙස අර්ථ දැක්විය හැකි ය.

## ව්‍යාපාර කටයුතු කර ගෙන යාමේ දී සිදු විය හැකි විවිධාකාර අවදානම්

**නිදසුන් :**

- ව්‍යාපාරය ගිනි ගැනීම
- සොරසතුරු උවදුරු
- ව්‍යාපාරය පාඩු ලැබීම
- ව්‍යාපාරයේ දේපළවලට සිදු විය හැකි හානි

ClassWork.LK

## රක්ෂණය වර්ග කිරීම

අවදානම්, රක්ෂණය කළ හැකි අවදානම් හා රක්ෂණය කළ නො හැකි අවදානම් ලෙස වර්ග කළ හැකි ය.

## රක්ෂණය කළ හැකි අවදානම්

## රක්ෂණය කළ හැකි අවදානම් සඳහා උදාහරණ

- ගොඩනැගිලි ගිනි ගැනීම මගින් සිදු වන අවදානම්
- රථවාහන අනතුරු අවදානම්
- මාර්ගස්ථ මුදල්වලට සිදු වන හානි
- ණයගැතියකුගෙන් ලැබිය යුතු මුදල් නො ලැබීමේ අවදානම

ClassWork.LK

## රක්ෂණය කළ හැකි අවදානම්වල තිබිය යුතු ලක්ෂණ

- අවදානම පුරෝකථනය කළ හැකි වීම
- අනාගතයේ සිදු විය හැකි අවදානම මූල්‍යමය වශයෙන් තක්සේරු කළ හැකි වීම
- අවදානම නියත නො විය යුතු වීම. එනම් අලාභය සිදු විය යුත්තේ අහඹු ලෙස වීම
- සම්බන්ධතාවලින් තොර වීම. එනම් සිදු වූ පාඩුව වෙනත් රක්ෂිත අලාභ හා සම්බන්ධ නො විය යුතු ය.
- සත්‍යාපනය කළ හැකි වීම. එනම් අලාභය සිදු වීමේ හේතුව, ස්ථානය, වේලාව හා ප්‍රමාණය විශ්ලේෂණය කළ හැකි විය යුතු ය.

ClassWork.LK

# රක්ෂණය කළ නොහැකි අවදානම්

රක්ෂණය කළ හැකි අවදානමක් වීම සඳහා රක්ෂණය කළ හැකි අවදානම්වල තිබිය යුතු ලක්ෂණ ඉටු වීම අවශ්‍ය වේ.

එම කරුණු ඉටු නො වන්නේ නම් ඒවැනි අවදානම් රක්ෂණය කළ නො හැකි අවදානම් වේ.

## රක්ෂණය කළ නො හැකි අවදානම් සඳහා උදාහරණ

- ව්‍යාපාරය පාඩු ලැබීම
- ස්වභාවික හේතූන් නිසා ඇති වන අවදානම් (ක්ෂයවීම්, යල්පැනීම්, වාෂ්පවීම්)
- තම හැකියා හා ශක්තිය මත තීරණය වන අවදානම් (විභාග අසමත් වීම, ආදරය අහිමි වීම)
- මෝස්තර වෙනස්වීම් නිසා සිදු වන අවදානම්

ClassWork.LK

# <u>ව්‍යාපාරවල පැවැත්ම සඳහා රක්ෂණය වැදගත් වන ආකාරය</u>

- රක්ෂණය මගින් ව්‍යාපාර අවදානම් ආවරණය කරන නිසා ව්‍යාපාර ආරම්භ කිරීමට ආයෝජකයින් පෙළඹීම

- ආබාධිත තත්ත්වයක දී හෝ මරණයක දී මූල්‍යමය ආරක්ෂාව ලැබීම (සේවකයන්ට)

- රක්ෂණ සමාගම් තමන් සතු අරමුදල් නැවත ආයෝජනය කිරීමෙන් රටේ ආර්ථික සංවර්ධනයට අවශ්‍ය ප්‍රාග්ධනය සැපයීම

- මුහුදු උවදුරු රක්ෂණය නිසා ජාත්‍යන්තර වෙළෙඳම දියුණු වීමයි

ClassWork.LK

## රක්ෂණ ගිවිසුම

රක්ෂණ ගිවිසුමක් යනු රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට අපේක්ෂා කරන පුද්ගලයා ඉදිරිපත් කරන රක්ෂණ යෝජනා පත්‍රයක්, රක්ෂණ ආයතනය විසින් පිළිගැනීමෙන් පසු එම දෙපාර්ශ්වය අතර ඇති කර ගන්නා ලිඛිත එකඟතාවයි.

## රක්ෂණ ඔප්පුව

රක්ෂණ ඔප්පුව යනු කසියම් ජීවිතයකට හෝ දේපළයකට අදාළ ව රක්ෂණ ගිවිසුමක් ඇති වූ පසු ව ඊට අදාළ ව රක්ෂණ සමාගම විසින් රක්ෂිතයාට දෙනු ලබන ලිඛිත සහතකි යයි.

ClassWork.LK

# රක්ෂණ ගිවිසුමකට සම්බන්ධ පාර්ශ්ව

## පළමු පක්ෂය (රක්ෂිතයා)

රක්ෂණ යෝජනාව ඉදිරිපත් කරන්නා හෙවත් රක්ෂණ ආවරණය ලබා ගන්නා පුද්ගලයා

## දෙවන පක්ෂය - (රක්ෂකයා)

රක්ෂණ යෝජනාව පිළිගන්නා පාර්ශ්වය හෙවත් රක්ෂණ සමාගම

- මෙයට අමතර ව තෙවන පක්ෂය නමින් පාර්ශ්වයක් ද සිටිය හැකි ය. තෙවන පක්ෂය යනු ගිවිසුමේ ක්‍රියාකාරිත්වය තුළින් ඇති වන බාහිර පක්ෂ පිළිබඳ සම්බන්ධතාවයි.

ClassWork.LK

## රක්ෂණ ගිවිසුමක් වලංගු වීම සඳහා පැවතිය යුතු මූලිකාංග

- නෛතික බැඳීමක් ඇති කර ගැනීමේ අදහස
- අර්පනය හෙවත් යෝජනාව
- ප්‍රතිග්‍රහණය හෙවත් පිළිගැනීම
- නෛතික බව - නීතියට එකඟ බව
- ඒ ඒ පාර්ශ්වයන්ට නෛතික බැඳීමක් ඇති කර ගැනීමට ඇති හැකියාව

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය

ආර්ථික විද්‍යාව

ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

# INSURANCE
# (Part-II)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# රක්ෂණ මූලධර්ම

රක්ෂණ ව්‍යාපාරය ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා අනුගමනය කළ යුතු මූලධර්ම රක්ෂණ මූලධර්ම නම් වේ.

## රක්ෂණ මූලධර්ම

- රක්ෂ්‍ය හිමිකම
- උපරිම විශ්වාසය
- හානිපූර්ණය
- ආදේශනය
- දායකත්වය
- ආසන්න ම හේතුව

ClassWork.LK

# රක්ෂ්‍ය හිමිකම

යම් විෂය වස්තුවක් පැවතීමෙන් ආර්ථිකමය වාසියකුත්, එය අහිමිවීමෙන් ආර්ථිකමය අවාසියකුත් ඇති වන ඕනෑම දෙයක් සම්බන්ධව ඇති හිමිකම, රක්ෂ්‍ය හිමිකම වේ.

**නිදසුන් :**

- ස්වාමිපුරුෂයාගේ ජීවිතය පිළිබඳ භාර්යාවටත්, භාර්යාවගේ ජීවිතය පිළිබඳ ව ස්වාමියාටත් රක්ෂ්‍ය හිමිකමත් ඇත.

- යම් දේපළක නීත්‍යානුකූල අයිතිකරුට එම දේපළ පිළිබඳ ව රක්ෂ්‍ය හිමිකමක් ඇත. (තමාගේ මෝටර් රථය, ඉඩම් වැනි)

- ණය හිමියෙකුට ණය ගැතියෙකුගේ ජීවිතය තම ණය ප්‍රමාණය දක්වා රක්ෂණය කිරීමට හිමිකමක් ඇත.

ClassWork.LK

## <u>උපරිම විශ්වාසය</u>

රක්ෂණය කරනු ලබන විෂය වස්තුව සම්බන්ධයෙන් රක්ෂකයා සහ රක්ෂිතයා විසින් හෙළිදරව් කළ යුතු රක්ෂණ ගිවිසුමට අදාළ සියලු තොරතුරු සද්භාවයෙන් යුතු ව හෙළිදරව් කිරීම උපරිම විශ්වාසය වේ.

## <u>හානි පූර්ණය</u>

යම් රක්ෂිත දේපළකට හානියක් වූ විට එම දේපළ යථා තත්ත්වයට පත්කර ගැනීමට ප්‍රමාණවත් වන්දි මුදලක් පමණක් ගෙවීම හානි පූර්ණය ලෙස හඳුන්වයි.

**නිදසුන් :**

රුපියල් ලක්ෂ 40 ක් වටිනා මෝටර් රථය එම මුදලට ම රක්ෂණය කර ඇති අවස්ථාවක රු. ලක්ෂ 2.5 ක අලාභයක් සිදු වුව හොත් වන්දි වශයෙන් රු. ලක්ෂ 2.5 ක් පමණක් ලැබීම

ClassWork.LK

# දායකත්වය මූලධර්මය

යම් දේපළක් රක්ෂණ ආයතන කිහිපයක රක්ෂණය කර ඇති විටක එම දේපළට යම් හානියක් සිදු වූ විටක ඒ සඳහා සියලු ම රක්ෂණ සමාගම් අනුපාතික ව දායක වී වන්දි ගෙවීම දායකත්වය මූලධර්මය ලෙස හඳුන්වයි.

**නිදසුන් :**

රුපියල් ලක්ෂ 10 ක දේපළක් A, B හා C යන රක්ෂණ සමාගම් තුනක අනුපිළිවෙලින් ලක්ෂ 5, ලක්ෂ 3 හා ලක්ෂ 2 බැගින් රක්ෂණය කර ඇති විටක එම දේපළට රු. 100 000 ක හානියක් සිදු වුයේ නම් 5: 3: 2 අනුපාතයට A රු. 50 000 ක් ද රු. 30 000 ක් ද C රු. 20 000 ක් ද වශයෙන් වන්දියට දායක වේ.

Class Work LK

# ආදේශන මූලධර්මය

රක්ෂිත දේපළකට සිදු වූ හානියක දී රක්ෂණ සමාගම වන්දි ගෙවීමෙන් පසු ව බාහිර පාර්ශ්වයන්ගෙන් රක්ෂිතයාට ලබා ගත හැකි වෙනත් වාසි හා අයිතීන් රක්ෂකයා පවරා ගැනීම ආදේශන මූලධර්මය ලෙස හඳුන්වයි.

**නිදසුන් :**

රුපියල් ලක්ෂ 50 කට රක්ෂණය කළ මෝටර් රථයකට සිදු වූ අනතුරකින් එම රථය මුළුමනින් ම විනාශ වුයේ නම්, රක්ෂණ සමාගම රු. ලක්ෂ 50 ම වන්දි වශයෙන් ගෙවන අතර මෝටර් රථයේ සුන්බුන් වටිනාකම පවරා ගනී.

ClassWork.LK

# ආසන්න ම හේතුව මූලධර්මය

රක්ෂිත දේපළකට හෝ ජීවිතයකට සිදු වූ හානියක දී එම හානිය සිදු වීමට හේතු කිහිපයක් බලපා ඇති විටෙක, හානිය සිදු වීමට බලපෑ ආසන්න ම හේතුව රක්ෂණ ඔප්පුවෙන් ආවරණය වී ඇත්නම් පමණක් වන්දි ගෙවන බව ආසන්න ම හේතුව මූලධර්මයෙන් දැක්වේ.

**නිදසුන් :**

සොරබිය රක්ෂණ ඔප්පුවක් හිමි පුද්ගලයෙකුට තම නිවසට ගින්නකින් හානියක් සිදු වුව හොත් වන්දි ලබා ගත නො හැකි ය. එයට හේතුව හානිය සිදු වීමට බලපෑ හේතුව වන ගින්න සොරබිය රක්ෂණ ඔප්පුවෙන් ආවරණය වී නො තිබීමයි.

ClassWork.LK

# ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් වැදගත් කරුණු

ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් රක්ෂ්‍ය හිමිකම, උපරිම විශ්වාසය හා ආසන්න ම හේතුව යන මූලධර්ම පමණක් අදාළ වේ. හානිපූර්ණ මූලධර්මය හා එයට අයත් උපමූලධර්ම වන දායකත්වය හා ආදේශනය යන මූලධර්ම ජීවිත රක්ෂණයට අදාළ නො වේ.

එයට හේතුව ජීවිතය හානි වීමෙන් හෝ අනතුරට පත් වීමෙන් වන හානිය මුදලින් මැනිය නො හැකි වීමත් එය යථා තත්ත්වයට පත් කළ නොහැකි වීමත් ය.

ජීවිත රක්ෂණයේ දී ඔප්පුවේ සඳහන් යම් නිශ්චිත වටිනාකමක් වන්දි වශයෙන් ප්‍රදානය කෙරේ.

ClassWork.LK

# ප්‍රතිරක්ෂණය

රක්ෂණ සමාගමක් විසින් භාර ගන්නා ලද රක්ෂණ අවදානමක් එම ආයතනය විසින් තවත් රක්ෂණ සමාගමක හෝ කිහිපයක රක්ෂණය කිරීම ප්‍රතිරක්ෂණය ලෙස හඳුන්වයි. ප්‍රතිරක්ෂණය මගින් රක්ෂණ සමාගම්වල වගකීම විතැන් කළ හැකි නිසා රක්ෂිතයාගෙන් අය කරනු ලබන වාරික මුදල අඩු මට්ටමක පවතී.

# ප්‍රාරක්ෂණය

විශාල වටිනාකමක් ඇති වත්කමක් සම්බන්ධයෙන් ඇති අවදානමක් කොටස් වශයෙන් වෙන් කර රක්ෂණ සමාගම් කිහිපයකට භාර දීම හා අනතුරක් සිදු වූ විට තමන් භාරගත් අවදානමේ ප්‍රමාණයට ඒ ඒ රක්ෂණ සමාගම් වන්දි ගෙවීම
ප්‍රාරක්ෂණය ලෙස හඳුන්වයි.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

# INSURANCE
# (Part-III)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# රක්ෂණ වර්ග

- ජීවිත රක්ෂණය / දිගුකාලීන රක්ෂණය

- සාමාන්‍ය රක්ෂණය

# ජීවිත රක්ෂණය / දිගුකාලීන රක්ෂණය (Life Insurance)

රක්ෂිතයාගේ මරණය සහ වෙනත් ශාරීරික උපද්‍රව හේතුවෙන් අවදානම්වලට මුහුණ පෑ විට රක්ෂිතයාට හෝ ඔහුගේ යැපෙන්නන්ට මූල්‍යමය ප්‍රතිලාභ ලබා දීම ජීවිත රක්ෂණයේ දී සිදු වේ.

ජීවිත රක්ෂණයේ අරමුණු වන්නේ මරණය, අකර්මන්‍යතාව හෝ මහලුවියට පත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් යම් පුද්ගලයෙකුට සිදු විය හැකි හානි වෙනුවෙන් ආරක්ෂාව සලසා ගැනීමයි.

ජීවිත රක්ෂණය යම් නිශ්චිත කාලසීමාවක් සඳහා ලබා ගන්නා අතර, රක්ෂිතයා එකී කාලසීමාව තුළ මිය ගියහොත් එකඟ වූ මුළු රක්ෂිත වටිනාකම යැපෙන්නන්ට හෝ නම් කළ පුද්ගලයාට හිමි වන අතර, රක්ෂිතයා එකී කාල සීමාව අවසන් වන තෙක් ජීවත් ව සිටිය හොත් කාලසීමාව අවසානයේ රක්ෂණ ඔප්පුවේ වටිනකම හා ප්‍රතිලාභ රක්ෂිතයාට ලබා ගත හැකි ය.

ClassWork LK

# ජීවිත රක්ෂණය සෙසු රක්ෂණවලින් වෙනස් වන ආකාරය

- ජීවිත රක්ෂණයේ අවදානම නිශ්චිත අතර සෙසු රක්ෂණවල අවදානම නිශ්චිත නො මැත.

- ජීවිත රක්ෂණය සම්බන්ධ ව හානිපූර්ණ මූලධර්මය අදාළ නො වන අතර, සෙසු රක්ෂණ සඳහා මෙම මූලධර්ම ආදාළ වේ.

- ජීවිත රක්ෂණය ඉතිරි කිරීමකට සමාන වන අතර, සෙසු රක්ෂණ සඳහා වන්දි ලබා ගත හැකි වන්නේ හානියක් සිදු වුවහොත් පමණි.

- ජීවිත රක්ෂණ ඔප්පුව පැවරිය නො හැකි අතර, සෙසු රක්ෂණ ඔප්පු පැවරැය හැකි ය.

ClassWork.LK

# සාමාන්‍ය රක්ෂණය (General Insurance)

## සාමාන්‍ය රක්ෂණ වර්ග

- ගිනි රක්ෂණය
- සොරකම් රක්ෂණය
- ස්වාභාවික විපත් රක්ෂණය
- සමුද්‍රීය රක්ෂණය
- මෝටර් රථ රක්ෂණය
- වගකීම් රක්ෂණය
- මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය
- මාර්ගස්ථ මුදල් රක්ෂණය

ClassWork.LK

# ගිනි රක්ෂණය (Fire Insurance)

කිසියම් පුද්ගලයෙකුට, ගොඩනැගිලි හෝ වෙනත් වත්කම්වලට ගින්නෙන් සිදු විය හැකි හානි ආවරණය කර ගැනීම සඳහා ලබා ගත හැකි රක්ෂණය ගිනි රක්ෂණය වේ.

ගිනි රක්ෂණය යටතේ ගිනි හානිවලට අමතර ව අතිරේක වාරික මුදල් ගෙවීමෙන් ගිනි රක්ෂණ ඔප්පුව දීර්ඝ කර ගැනීමට හැකියාව ලැබේ.

ClassWork.LK

## ගිනි රක්ෂණය මගින් ආවරණය කර ගැනීමට හැකි අවදානම්

- කැරලි කෝලාහල/වැඩ වර්ජන හානි
- පිපිරීම් හානි
- විදුලිමය ආපදා හානි
- භූමි කම්පා /සුනාමි
- ජල ගැලීම්, සුළි සුළං/ කුණාටු වැනි
- ගුවන්යානා අනතුරු
- ගැටීම් හානි
- ආනුශංගික අලාභ හානි

ClassWork.LK

## සොරබිය රක්ෂණය (Theft Insurance)

ව්‍යාපාරික ස්ථානවල හෝ නිවාසවල සිදු විය හැකි සොරබිය අවදානම ආවරණය කර ගැනීම සඳහා සොරබිය රක්ෂණ ඔප්පු ලබා ගත හැකි ය.

## ස්වභාවික විපත් රක්ෂණය (Natural Disaster Insurance)

කුණාටු වැනි දේවලින් දේපලවලට සිදු වන හානි ආවරණය සඳහා ස්වභාවික විපත් රක්ෂණාවරණයක් ලබා ගැනීමට හැකි ය.

ClassWork.LK

# සමුද්‍රීය රක්ෂණය (Marine Insurance)

මුහුදු මාර්ග ප්‍රවාහනයේ දී නැවට හා නැව් බඩුවලට සිදු විය හැකි හානි සමුද්‍රීය රක්ෂණය මගින් ආවරණය වේ.

## සමුද්‍රීය රක්ෂණයේ මූලික කොටස්

- නැව්කඳ රක්ෂණය (Hull)
- නැව් බඩු රක්ෂණය (Cargo)

## නැව්කඳ රක්ෂණය යටතේ ලබා ගැනීමට හැකි විවිධ රක්ෂණ ඔප්පු වර්ග

- සියලු අවදානම් ඔප්පුව
- පූර්ණ අලාභය පමණක් ගෙවන ඔප්පුව
- තොටුපල ඔප්පුව
- අලුත්වැඩියා ඔප්පුව
- තැනීම් හානි ඔප්පුව

ClassWork.LK

## නැව්බඩු රක්ෂණය යටතේ ලබා ගැනීමට හැකි විවිධ ඔප්පු වර්ග

- ඇගයූ ඔප්පුව
- විවෘත ඔප්පුව/චල ඔප්පුව
- අනාගත ආවරණ ඔප්පුව

ClassWork.LK

# මෝටර් රථ රක්ෂණය
# (Motor Traffic Insurance)

රථවාහන අනතුරුවලින් මෝටර් රථවලට, මෝටර් රථවල ගමන් ගන්නා අයට හා බාහිර පාර්ශ්වයන්ට සිදු විය හැකි හානි සඳහා වන්දි ලබා ගැනීම පිණිස රථවාහන හිමියෙකු හා රක්ෂණ සමාගමක් අතර ඇති කර ගන්නා එකඟතාවයයි.

## මෝටර් රථ වාහන රක්ෂණය යටතේ ලබා ගත හැකි රක්ෂණ ඔප්පු වර්ග

- සම්පූර්ණ වගකීම් සහිත රක්ෂණ ඔප්පුව/ විස්තීර්ණ රක්ෂණ ඔප්පුව
- තෙවන පාර්ශ්ව ගිනි හා සොරකම් රක්ෂණය
- අවම තෙවන පාර්ශ්ව රක්ෂණය

ClassWork.LK

## සම්පූර්ණ වගකීම් සහිත රක්ෂණ ඔප්පුව

සම්පූර්ණ වගකීම් සහිත රක්ෂණ ඔප්පුව මගින් අදාළ වාහනයට, වාහනයේ ගමන් ගන්නා පුද්ගලයින්ට හා දේපළවලට සිදු වන හානි ආවරණය වේ.

## තෙවන පාර්ශ්ව ගිනි හා සොරබිය රක්ෂණය

තෙවන පාර්ශ්ව ගිනි හා සොරබිය රක්ෂණය මගින් අදාළ වාහනයට ගින්නෙන් හා සොරකම් කිරීම්වලින් සිදු වන හානිවලට අමතර ව බාහිර පුද්ගලයින්ට හා දේපළවලට, සිදු වන හානි ආවරණය වේ.

## අවම තෙවන පක්ෂ රක්ෂණය

අවම තෙවන පක්ෂ රක්ෂණය මගින් තෙවන පාර්ශ්වයන්ට, දේපලවලට සිදු වන හානි පමණක් ආවරණය වේ. මෝටර් රථයක් මහා මාර්ගයේ ධාවන කිරීම සඳහා අවම වශයෙන් අවම තෙවන පක්ෂ රක්ෂණ ඔප්පුව හෝ ලබා ගත යුතු ය.

ClassWork.LK

# වගකීම් රක්ෂණය (The Liability Insurance)

වගකිම් රක්ෂණය යනු වෙනත් පාර්ශ්වයන්ට සිදු වන පාඩු පිළිබඳ ව ඇති වන වගකීම රක්ෂණය කිරීමයි. මෙම රක්ෂණය නිසා ව්‍යාපාරිකයින්ට ඔවුන් නිසා වෙනත් පාර්ශ්වයන්ට සිදු වන හානි පිළිබඳ වගකීමෙන් ආරක්ෂා වීමට හැකි වේ.

## වගකීම් රක්ෂණය යටතේ ලබා ගත හැකි වගකීම් රක්ෂණ ඔප්පු වර්ග

### පොදු (මහජන) වගකීම් රක්ෂණය (General Liability Insurance)

දේපළ හෝ ව්‍යාපාර කටයුතුවලින් පැන නැගිය හැකි අහඹු සිද්ධීන් නිසා තුන්වන පාර්ශ්වයකට සිදුවිය හැකි හානි වෙනුවෙන් එම දේපළ අයිතිකරු විසින් හෝ ව්‍යාපාරිකයින් විසින් ලබා ගන්නා රක්ෂණාවරණයයි.

ClassWork.LK

## නිෂ්පාදන වගකීම් රක්ෂණය
## (Product Liability Insurance)

ව්‍යාපාරයක් අලෙවි කරන නිෂ්පාදිත පාරිභෝජනය කිරීමෙන් පාරිභෝගිකයින්ට සිදුවිය හැකි හානි ආවරණය කිරීම සඳහා ව්‍යාපාරිකයින් විසින් ලබා ගන්නා රක්ෂණාවරණයයි.

## සේව්‍ය වගකීම් රක්ෂණය
## (Employer Liability Insurance)

සේවයේ යෙදී සිටිය දී සේවකයින්ට සිදු වන අනතුරු වෙනුවෙන් වන්දි ගෙවීම සේව්‍යාගේ වගකීමයි. එවැනි අවස්ථාවක වන්දි ගෙවීමේ වගකීම රක්ෂණ ආයතනයකට පැවරිය හැකි ය.

තමන් යටතේ සේවය කරන අයට සේවයෙහි යෙදී සිටිය දී, සේවයේ යෙදීම නිසා ම ඇතිවන්නා වූ තුවාල හා අසනීප වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා සේව්‍යයන් විසින් ලබා ගන්නා රක්ෂණය සේවා යෝජක වගකීම් රක්ෂණය වේ.

ClassWork.LK

# මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය

මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණයේ දී ගොඩබිමින් භාණ්ඩ ප්‍රවාහණය කිරීම සඳහා ප්‍රවාහන මාධ්‍යයට භාණ්ඩ පැට වූ අවස්ථාවේ සිට එම භාණ්ඩ ගොඩබෑම දක්වා වූ අවස්ථාව දක්වා සිදු විය හැකි හානි ආවරණය සඳහා ලබාගන්නා රක්ෂණය මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය වේ.

# මාර්ගස්ථ මුදල් රක්ෂණය

එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට මුදල් රැගෙන යාමේ දී සිදු විය හැකි හානි ආවරණය සඳහා ලබා ගන්නා රක්ෂණය මාර්ගස්ථ මුදල් රක්ෂණයයි.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

**www.ALNoteBook.com**

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."